# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1814/68 - 2013 ජුනි මස 14 වැනි සිකුරාදා - 2013.06.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/10/07/2009.

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2010.11.25 වැනි දිනැති හා අංක 1681/37 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2010.11.15 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් බොරලැස්ගමුව, දිවුල්පිටිය, ජනජය මාවත, නො. 219 හි පදිංචි එන්. ජේ. කරුණානායක මහතා, කැළණිය, දළුගම, මූනමල්ගහවත්ත පාර, නො. 346/2 හි පදිංචි එච්. ඒ. ඩී. ටී. එන්. හප්පිටිය මහතා හා අනෙක් පාර්ශවය වශයෙන් නුගේගොඩ, තලපත්පිටිය හි පිහිටි ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2013.05.06 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. චාන්දනී අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2013 ජුනි මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/10/07/2009.

කාර්මික අධිකරණයේදී ය.

01. එන්. ජේ. කරුණානායක මහතා,
නො. 219, ජනජය මාවත,
දිවුල්පිටිය,
බොරලැස්ගමුව.

02. එච්. ඒ. ඩී. ටී. එන්. හප්පිටිය මහතා,
නො. 346/2, මූනමල්ගහවත්ත පාර,
දළුගම,
කැළණිය.

*ඉල්ලුම්කරුවෝ .........*

නඩු අංකය : A/3360

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල,
තලපත්පිටිය,
නුගේගොඩ.

*සේවා යෝජක වගඋත්තරකරු............*

ප්‍රදානය

කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන ඇමති ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14, 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඔහුගේ 2010.11.15 වෙනි දිනැති නියෝගයෙන් මා පත් කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවතින කරුණු වනුයේ,

01. අංක 380/61 හා 1985.12.20 වෙනි දිනැති රජයේ *අති විශේෂ ගැසට් පත්‍ර* මගින් විගණක පරීක්ෂක iii වන ශ්‍රේණිය සංක්‍රාන්තික සේවයක් බවට කලින් ප්‍රකාශයට පත් කර තිබියදී, 1997.05.02 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එන්. ජේ. කරුණානායක හා එච්. ඒ. ඩී. ටී. එන්. හප්පිටිය යන



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මහත්වරුන් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ පාලක මණ්ඩලය විසින් එහි අභ්‍යන්තර විගණක සහකාර සේවයේ iii වන ශ්‍රේණියට පත් කිරීම හේතුවෙන් ඔවුන්ට යම් අසාධාරණයක් සිදුවූයේ නම්, ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න හා,

02. ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ පාලක මණ්ඩලය විසින් එහි අභ්‍යන්තර විගණක සහකාරවරුන් වන එන්. ජේ. කරුණානායක සහ එච්. ඒ. ඩී. ටී. එන්. හප්පිටිය යන මහත්වරුන් 2006.09.22 වෙනි දින සිට බලපවත්වන පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 එම්.එන්. 5 වැටුප් ක්‍රමයේ පිහිටුවා ඉන් අනතුරුව, එනම්, 2007.12.12 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එම්.ටී, 2 - 2006 වැටුප් ක්‍රමය වශයෙන් සංශෝධනය කිරීමේ හේතුවෙන් ඔවුන්ට යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම් ඔවුන් එකිනෙකාට අදාළ විය යුතු නිවැරදි වැටුප් ක්‍රමය සහ ශ්‍රේණිය කුමක් ද යන්න හා එය ක්‍රියාත්මක විය යුතු දිනය කෙදිනක විය යුතු ද යන්න හා,

03. අංක 96/1347/120/143 හා 1996.07.10 වෙනි දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ 33 (අ) හා (ආ) වගන්ති ප්‍රකාරව එන්. ජේ. කරුණානායක හා එම්. ඒ. ඩී. ටී. එන්. හප්පිටිය යන මහත්වරුන්ට හිමි විය යුතු සහනයක් මොනවාද යන්න පිළිබඳව ද වේ.

03. ඉල්ලුම්කරුවන් දෙදෙනාගේ ඉල්ලීම ඉටු කිරීමට අපොහොසත් වී ඇත්තේ වගඋත්තරකාර පාර්ශවය බැවින් ප්‍රථමයෙන් සාක්ෂි මෙහෙයවීම එම පක්ෂයට මවිසින් පවරන ලදී. ඒ අනුව ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ පරිපාලන නිලධාරි සරත් රොබට්සන් මහතාගේ සාක්ෂිය 2011.05.31 වෙනි දින ආරම්භ කරන ලදී.

04. පැමිණිල්ල වෙනුවෙන් නීතිඥ බර්නාඩ් දිසානායක මහතා පෙනී සිටි අතර, වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ තවීෂා ජයසිංහ මෙනෙවිය පෙනී සිටියාය.

05. වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ තවීෂා ජයසිංහ මෙනෙවියගේ මූලික විමසීම්වලට පිළිතුරු දෙමින් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ පරිපාලන නිලධාරි සරත් රොබට්සන් මහතා මෙසේ පවසා ඇත.

(i) 1983 අංක 54 දරන පනතේ 7 වගන්තිය යටතේ ආයතනය සම්බන්ධයෙන් සම්පූර්ණ බලතල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇත.

(ii) R/02 අනුව සියළු ශ්‍රේණි වැටුප් 35% කින් වැඩි කරනු ලැබුවා.

(iii) R/03 A අනුව ගණකාධිකරණ විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් විෂයයන් 04 ක් සමත් වී තිබිය යුතු අතර, AAT හෝ ICAS ආවසරික විභාගය අමතර සුදුසුකම් ලෙස සලකන ලදී.

(iv) මෙම අධ්‍යාපන සුදුසුකම් ඇති පුද්ගලයින්ගෙන් A/04 පුවත් පත් දැන්වීම මගින් ඉල්ලුම් පත් කැඳවන ලදී.

06. දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි, ලිපි ලේඛන සහ ලිඛිත දේශනය සැළකිල්ලට ගැනීමේදී පහත සඳහන් කරුණු අනාවරණය වේ.

(i) 1996.07.17 වෙනි දින ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ 1996.10.06 වෙනි දිනැති "සන්ඩේ ඔබ්සර්වර්" පුවත් පතෙහි පල කරන ලද R/04 දරන දැන්වීම මුල් බැල්මට මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනා අදාළ සුදුසුකම් සපුරා තිබුණි.

(ii) රජයේ විගණන දෙපාර්තමේන්තුවේ මෙම තනතුරට (අභ්‍යන්තර විගණන සහකාර) සමාන තනතුරක් නොතිබුණු අතර, එම දෙපාර්තමේන්තුවේ දීප ව්‍යාප්ත සේවාවක් වන විගණන සේවාවක් ක්‍රියාත්මක විය. එම සේවාවේ සුදුසුකම් වූයේ :

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරීන්

(ආ) ශ්‍රී ලංකා රජයේ කාර්මික ආයතනයක ගණකාධිකරණ ඩිප්ලෝමාව හෝ වාණිජ ඩිප්ලෝමාව සමර්ථය ලද පුද්ගලයින් සහ

(ඇ) අවම වශයෙන් පහත සඳහන් විෂයයන්ගෙන් එකක් හෝ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හතරකින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් සමර්ථය ලද පුද්ගලයින්ට ගණකාධිකරණය, වාණිජ්‍යය සහ මූල්‍යය, අර්ථ ශාස්ත්‍රය සහ ගණිතය.

ඒ අනුව ඉහත අංක (ආ) හි සඳහන් ආයතනයේ අභ්‍යන්තර විගණන සහකාර තනතුරුවලට අදාළ සුදුසුකම් රජයේ විගණන දෙපාර්තමේන්තුවේ සුදුසුකම්වලට වඩා පහළ මට්ටමක ඇත. තවද රජයේ විගණන දෙපාර්තමේන්තුවේ ඉල්ලා ඇති සුදුසුකම් මෙම නිලධාරින්ට නැත.

(iii) මෙම තනතුරට බඳවා ගත් මුල් අවධියේදී ශ්‍රේණි ක්‍රමයක් නොතිබුණු අතර, 2007.07.01 වෙනි දින සිට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව ශ්‍රේණි ක්‍රමයක් ඇති කරන ලදී. එහිදී මෙම තනතුරට පහත සඳහන් ශ්‍රේණි ක්‍රමය හඳුන්වා දී ඇති අතර, 2005.12.31 වෙනි දින තෙක්ම බඳවා ගත් ශ්‍රේණියේම තබා ගන්නා ලදී. එනම් iii වෙනි ශ්‍රේණියේ :-

i ශ්‍රේණිය - ටී 3 - 8 - 2

ii ශ්‍රේණිය - ටී 15 - 1

iii ශ්‍රේණිය - ටී 2 - 2

07. මේ තනතුරු 2006.01.01 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නව වැටුප් චක්‍ර ලේඛයක් වන 06/2006 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛනය නිකුත් විය. මෙම චක්‍ර ලේඛය මගින් වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කරන ලදී. ඒ අනුව මෙම නව චක්‍ර ලේඛය මගින් තනතුරුවලට බඳවා ගැනීමේ සුදුසුකම් මත වැටුප් බාණ්ඩ තීරණය කර ඇත. (R/17, R/17 B, R/17 D විශේෂයෙන්ම උපලේඛන අංක 01 හි 69 වෙනි පිටුව)

08. වගඋත්තරකාර ආයතනයේ කරුණු දැක්වීම අනුව ඉල්ලුම්කරුවන් දෙදෙනාම අයත් නොවන සහ ඉහළ සුදුසුකම් ඉල්ලා ඇති ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරින්ට අයත් වැටුප් කාණ්ඩයේ ඛණ්ඩ 2 වැටුප් කාණ්ඩය වන MN - 5 - 2006 යටතේ 2006.01.01 වෙනි දින සිට 2007 දෙසැම්බර් මස දක්වා ගෙවීම් කර ඇත. මෙම වරද හෙලිදරව් වූ පසු නිවැරදි කිරීමට පෙර අදාළ චක්‍ර ලේඛයේ 22 වගන්තිය අනුව කටයුතු කරමින් වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් වගඋත්තරකාර ආයතනය විසින් උපදෙස් ලබාගන්නා ලදී. වගඋත්තරකාර ආයතනයේ මෙම ක්‍රියාවලිය නිවැරදි බැවින් එසේ කිරීම ගැන ඉල්ලුම්කාර පාර්ශවයෙන්ද විරෝධයක් නොවීය. වගඋත්තරකාර ආයතනය මේ ආකාරයට වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂමෙන් උපදෙස් ලබා ගැනීමෙන් එම ආයතනය සාධාරණ ලෙසත්, නිවැරදි ලෙසත් ක්‍රියා කර ඇත.

09. වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් ලබාගන්නා ලද උපදෙස් අනුව වගඋත්තරකාර ආයතනය 2007 දෙසැම්බර් මස අගදී ඉහත කී වරද නිවැරදි කරන ලදී, මෙහිදී මා අගේ කොට සලකන්නේ එසේ නිවැරදි කිරීමේදී අදාළ චක්‍රලේඛයේ 21 වෙනි වගන්තිය අනුව සේවකයින් දෙදෙනාට ගෙවන ලද වැඩිපුර මුදල් ආපසු අයකර ගැනීමට වගඋත්තරකාර ආයතනයට හැකියාවක් තිබුණද, එම ආයතනය එසේ නොකිරීමයි. මෙම ප්‍රදානයෙන් පසුවද එම මුදල් අයකර නොගනු ඇතැයි මම සිතමි.

11. ඉල්ලුම්කරුවන් විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද පැමිණිල්ල එම කොමිෂන් සභාව විසින් විමර්ශනය කරන ලදුව එම කොමිෂන් සභාවේ විමර්ශන පිටපතක් R/15 වශයෙන් සලකුණු කර බේරුම්කරණ අධිකරණයට ඉදිරිපත් කර ඇත. මානව හිමිකම් කොමිෂන් සභාවේ නීති නිලධාරිනී සසංකා රත්නායක මහත්මියගේ R/15 වාර්තාවේ මෙසේ සඳහන් කර ඇත.

පැමිණිලිකරුවන් මෙහිදී වගඋත්තරකාර ආයතනය තමන් විගණන සහකාර තනතුරට බඳවා ගන්නා අවස්ථාවේදී ඉල්ලා ඇති අධ්‍යාපන සුදුසුකම්වලට වඩා වැඩි අධ්‍යාපන සුදුසුකම් ලබා තිබුණද, එය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී අවසරික 1 හා 2 කොටස් සමත්ව තිබීම හා එය උපාධිය හා සමාන තත්වයේ සුදුසුකමක් බවත්, එය නොසලකා හැර MT 2 වැටුප් ලේඛනයේ පිහිටුවා ඇති බව ප්‍රකාශ කර ඇතද පැමිණිලිකරුවන් විගණන සහකාර තනතුරට බඳවා ගැනීමේ මූලික සුදුසුකම් තුළ එය අන්තර්ගත නොවන අතර, වැටුප් ශ්‍රේණිය තීරණය වනුයේ බඳවා ගැනීමේ මූලික සුදුසුකම් අනුව වේ.

12. වගඋත්තරකාර ආයතනය මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනාගේ ඉල්ලීම අනුව ක්‍රියා කිරීමේදී මෙම කරුණට අදාළව අර්ථ නිරූපන කිරීමට පූර්ව බලතල ඇති වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් උපදෙස් ලබාගෙන ඒ අනුව ක්‍රියාකර ඇත.

13. සියළු කරුණු සැලකිල්ලට ගැනීමේදි යොමුවේ 01 සහ 02 හි සඳහන් වන පරිදි අසාධාරණයක් මෙම සේවකයින් දෙදෙනාට සිදුවී ඇතැයි තහවුරු කිරීමට පැමිණිලි පාර්ශවය අපොහොසත් වී ඇත.

14. එසේ වුවද වගඋත්තරකාර පාර්ශවය දක්වන ලද කරුණු අනුව එන්. ජේ. කරුණානායක මහතාට වැඩිපුර ගෙවා ඇති රු. 25,800/- ක මුදල සහ එච්. ඒ. ඩී. ටී. එන්. හප්පිටිය මහතාට වැඩිපුර ගෙවා ඇති රු. 44,049/- ක මුදල ඔවුන්ගෙන් ආපසු අයකර නොගන්නා ලෙස මම නියෝග කරමි. ඉල්ලුම්කරුවන් දෙදෙනා වගඋත්තරකාර ආයතනයට මනා ලෙස සේවය කර ඇති නිසාත්, ආයතනයේ කාර්මික සාමය (Industrial peace) වර්ධනය කිරීමේ පියවරක් ලෙස සලකා මෙම මුදල් සේවකයින් දෙදෙනාගෙන් අය නොකරන ලෙසට මම නියෝග කරමි. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමෙන් එය සිදු කල හැකිය. මෙම සහනය හැර වෙනත් සහනයක් මා ලබා දෙන්නේ නැත.

ටී. පියසෝම,
(බේරුම්කරු)

2013.05.06 වන දින කොළඹ,
කම්කරු මහලේකම් කාර්යාලයේ කාර්මික අධිකරණයේ දී ය.

06-828

---

මගේ අංකය : IR/15/16/2010.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.06.10 වැනි දිනැති හා අංක 1709/47 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.06.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කඩවත, ගල්දොර පාර, රොක්ලන්ඩ්, අංක 189 හි පදිංචි කේ. ඩී. තිලකරත්න මහතා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 07, ග්‍රෙගරි මාවත, අංක සී 82, සභාපති අංශය හි පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2013.05.15 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. චාන්දනී අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2013 ජුනි මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කේ. ඩී. තිලකරත්න,
අංක 189, රොක්ලන්ඩ්,
ගල්දොර පාර,
කඩවත.

නඩු අංකය : A/3383 සහ

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
අංක සී. 82, ග්‍රෙගරි මාවත,
කොළඹ 07.

අතර පවතින කාර්මික ආරවුල පිළිබඳවයි.

## ප්‍රදානය

1957 අංක 14, 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් සංශෝධිත, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව ඉහත සඳහන් පාර්ශවයන් අතර පවතින කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2011.06.03 වෙනි දිනැති නියෝගයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඉහත නම් සඳහන් පාර්ශවයන් අතර පවතින කාර්මික ආරවුල වනුයේ, වැඩ බැලීමේ පාරිශ්‍රමික නොගෙවීම සම්බන්ධයෙනි. ඉල්ලුම්කාර කේ. ඩී. තිලකරත්න මහතා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මුදල් අංශයේ (ලැබීම් හා ගෙවීම්) අධ්‍යක්ෂ තනතුරු දරමින් සිටියදී, කොමිෂන් සභාව මුදල් අංශයේ (ගිණුම්) අධ්‍යක්ෂ තනතුරු දැරූ සයිකුල් ෂියාඩ් මහත්මිය 2005.05.06 වන දින වැඩ තහනමට ලක්කර ඇත. පැ. 5 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද ලිපියෙන් පුරප්පාඩු වූ තනතුරේ වැඩ බැලීම සඳහා ඉල්ලුම්කරු පත්කර ඇත. සිය තනතුරට අමතරව 2005.05.06 දින සිට 2007.03.26 දක්වා අධ්‍යක්ෂ (ගිණුම්) තනතුරේ වැඩ බැලීම වෙනුවෙන්, වැඩ බැලීමේ පාරිශ්‍රමිකය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉල්ලුම්කරුට ගෙවා නොමැති නිසා, එකී පාරිශ්‍රමිකය ගෙවීමට නියෝග කරන මෙන් කාර්මික අධිකරණයෙන් ඉල්ලීමක් කර ඇත.

ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් 2011.07.20 වන දින මෙම අධිකරණයට ලිඛිතව කරුණු දක්වමින් වගඋත්තරකාර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව කියා සිටියේ, පැමිණිලිකරු වැඩ බැලීමේ දීමනාවක් ලැබීමට සුදුසු නොවන බවයි. ඉල්ලුම්කරුගේ ඉල්ලීම් සම්බන්ධයෙන්, කොමිෂන් සභාව කිහිපවරක්ම අමාත්‍යාංශයට කරුණු ඉදිරිපත් කරන ලද බවත්, වැඩ බැලීමේ පත්වීමේ ස්වභාවය අනුව ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලද බවත්ය. කෙසේ වුවද එකී ලිඛිත සැලකිරීම් වල සඳහන් වන්නේ, ඉල්ලුම්කරුට වැඩ බැලීම වෙනුවෙන් රුපියල් දහසක (රු. 1,000) ක මාසික දීමනාවක් ගෙවීමට කොමිෂන් සභාව එකඟවූ නමුත්, ඉල්ලුම්කරු රුපියල් පන්දහසක (රු, 5,000) ක මාසික දීමනාවක් ඉල්ලා සිටි බවත්, ඉල්ලුම්කරුගේ එම ඉල්ලීම අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කරන ලද නමුත්, ඒ සඳහා අනුමැතිය නොලැබුණ බවත්ය. මෙම නඩුව විභාග කර අවසන්වීමෙන් පසුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ඉදිරිපත් කරන ලද ලිඛිත සැලකිරීම් වලින් ඉල්ලා ඇත්තේ, වැඩ බැලීමේ දීමනාවක් සඳහා ඉල්ලුම්කරුට හිමිකමක් නොමැති බවට නියෝගයක් කරන ලෙසය.

ඉල්ලුම්කරු වෙනුවෙන් හා වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි හා ලේඛණ අවධානයට ලක් කරන ලදී. පැ. 3 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද කොමිෂන් සභන පත්‍රිකාව අත්ව, ඊට අමුණා ඇති ආකෘතිය අනුව, ඒකක වශයෙන් බෙදා මුදල් අංශයේ රාජකාරි පැවරීමටත් සිදු කර ඇත. එම ලේඛනයේ සඳහන් කර ඇති ආකාරයට එසේ කර ඇත්තේ වඩාත් විධිමත් හා නිරවද්‍ය මූල්‍ය පාලනයන් හා ගිණුම්කරණයන් සඳහාය. අධ්‍යක්ෂ මුදල් යනුවෙන් තනතුරු දෙකක් ක්‍රියාත්මක වී ඇති බවත්, එක් තනතුරක් සියාඩ් මහත්මිය රාජකාරි කර ඇති අතර අනෙක් තනතුර ඉල්ලුම්කාර කේ. ඩී. තිලකරත්න මහතා රාජකාරි කර ඇත. පැ. 4 ලෙස ලකුණු කර ඇති ලේඛනය සියාඩ් මහත්මිය වැඩ තහනමට ලක් කරමින් කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද ලිපියයි. එකී ලිපියේ පිටපතක් ඉල්ලුම්කාර කේ. ඩී. තිලකරත්න මහතාට යවා ඇත්තේ, "අධ්‍යක්ෂ මුදල් තනතුරේ රාජකාරි බාර ගැනීම සඳහා" ය. ඒ සමගම අධ්‍යක්ෂ මුදල් තනතුරේ වැඩ බැලීම සඳහා පත් කරමින් ඔහු වෙත ලිපියක් යවා ඇත. (පැ.5) ඉල්ලුම්කාර තිලකරත්න මහතා වැඩ බලන ලද තනතුරට කේ. යූ. බී. ඒකනායක මහතා පත් කරමින් 2007.03.19 වන දින දරන පත්වීම් ලිපිය කෙරෙහිද (පැ.6) අවධානය යොමු කලෙමි. පැ. 7 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද, කොමිෂන් සභාවේ සභාපති විසින් ඒකනායක මහතා වෙත යවන ලද ලිපියේ සඳහන් වන්නේ, "දැනට වැඩ බලන අධ්‍යක්ෂ මුදල් සේවය කරනු ලබන කේ. ඩී. තිලකරත්න මහතා වෙතින් අධ්‍යක්ෂ මුදල් තනතුරට අයත් රාජකාරි කටයුතු බාරගෙන වාර්තා කරන " ලෙසය. එසේම එමගින් තිලකරත්න මහතාටද දැනුම් දී ඇත්තේ, අධ්‍යක්ෂ මුදල් තනතුරේ රාජකාරි කටයුතු බාරදී සභාපති වෙත වාර්තා කරන ලෙසය. පැ.4, පැ.5, පැ.6, පැ.7 ලේඛන වලින් පැහැදිලි වන්නේ, අධ්‍යක්ෂ මුදල් යනුවෙන් වෙනම තරතුරක් පැවති බවත්, ඉල්ලුම්කාර තිලකරත්න මහතා වැඩ බැලීම සිදු කර ඇත්තේ, එම තනතුරේ බවත්ය.

ඉල්ලුම්කරුට වැඩ බැලීමේ පරිශ්‍රමිකයක් හෝ දීමනාවක් ඉල්ලීමට අයිතියක් නොමැති බවට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව දරන ස්ථාවරය පහත සඳහන් කාරණා මත ද ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරමි. කොමිෂන් සභාව මෙම නඩු විභාගයේදී, R 1 ලෙස ලකුණු කර ලේඛනයක් ඉදිරිපත් කරන ලදී. එම ලේඛනය නම්, අධ්‍යක්ෂ මුදල් තනතුරේ වැඩ බැලීමේ වැටුප හෝ මාසිකව රුපියල් පන්දහසක (රු. 5,000) දීමනාවක් ඉල්ලා ඉල්ලුම්කරු 2006.01.10 වන දින ඉදිරිපත් කරන ලද ලිපියයි. කොමිෂන් සභාවේ සභාපතිවරයා එකී ලිපියේ යොදා ඇති සටහන වනුයේ, "ඉ.ප්‍ර.කො. ආවරණ අනුමැතියට යටත්ව රුපියල් පන්දහසක මුදලක් අනුමත කරමි. " යනුවෙනි. R 2 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද කොමිෂන් පත්‍රිකාවේ සඳහන් වනුයේ (පිටුව 3), "සභාපතිතුමා විසින් රුපියල් පන්දහසක මුදලක් ගෙවීමට අනුමත කිරීමෙන් එය වැඩ බැලීමේ වැටුප නොව, දීමනාවක් පැහැදිලි වේ. එබැවින් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය අවශ්‍ය නොවේ." යනුවෙනි R3 ලේඛනයේ සඳහන් වන්නේ, "අධ්‍යක්ෂ මුදල් තනතුරේ වැඩ බැලීම අධ්‍යක්ෂ කේ. ඩී, තිලකරත්න මහතා පත් කරන ලද දිනයේ සිට රුපියල් දාහක වැඩ බැලීමේ දීමනාවක් ගෙවීම අනුමත කරන ලදී. " යනුවෙනි. එකී ලේඛන වලින් පැහැදිලි වන්නේ, "වැඩ බැලීමේ දීමනාවක්" ගෙවීමට කොමිෂන් සභාව මුල සිටම එකඟත්වය පළ කර ඇති බවයි. එවැනි ස්ථාවරයක් දරා පසුව වැඩ බැලීමේ දීමනාවක් සඳහා ඉල්ලුම්කරුට හිමිකමක් නොමැති බවට නියෝග කරන ලෙසට ඉල්ලා සිටීම අයුක්ති සහගත සහ අසාධාරණ ඉල්ලීමක් වේ.

වැඩ බැලීම වෙනුවෙන් රුපියල් දාහක් ලබා ගැනීම ප්‍රතික්ෂේප කර ආයතන සංග්‍රහයේ සඳහන් වැඩ බැලීමේ වැටුප ඉල්ලා ඉල්ලුම්කරු, 2006.05.17 දින කොමිෂන් සභාව වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත. (R 4) එකී ඉල්ලීම පිළිබඳව තීරණයක් ඉල්ලා කොමිෂන් සභාව කෘෂිකර්ම අමාත්‍යාංශයට ලිපියක් යොමු කර ඇත. (R 5) අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත ලිපියක් එවා ඇත. (R 6) නැවත තීරණයක් ඉල්ලා කොමිෂන් සභාව අමාත්‍යාංශයට

ලිපියක් යවා ඇත. (R 7) ඊට පිළිතුරු ලෙස අමාත්‍යාංශය විසින් (R 8) ලෙස දරන ලිපිය එවා ඇත. ඉන්පසු ඉදිරිපත් කරන ලද කොමිෂන් පත්‍රිකාව (R 9) එම කොමිෂන් පත්‍රිකාව පිළිබඳව තීරණය (R 10) හා 6296 දරන කොමිෂන් පත්‍රිකාව (R 11) යන ලේඛන කෙරේ අවධානය යොමු කලෙමි. එකී ලේඛන පිළිබඳව සියල්ලෙන්ම පැහැදිලි වන්නේ, ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විවිධ ස්ථාවරවල පිහිටා කටයුතු කර ඇති බවත්, අමාත්‍යාංශයෙන් උපදෙස් ලබා ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කර නොමැති බවත්ය. එම ඉල්ලුම්කරු විශ්‍රාම ගන්වන තෙක් පැහැදිලි තීරණයකට එළඹීමට කොමිෂන් සභාව අසමත්වී ඇත. එසේම මෙම කරුණ සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයා විසින් පරීක්ෂණයක් පවත්වා අදාළ ගෙවීම් ඉල්ලුම්කරුට ගෙවන ලෙසට කොමිෂන් සභාවට දැනුම් දී ඇති අතර, ඊට එරෙහිව අභියාචනාධිකරණයට ඉල්ලීමක් කර ඇති නමුත්, පසුව එයද ඉවත් කරගෙන ඇත.

ඉහත කරුණු සියල්ල සලකා බලා මා තීරණය කරනුයේ ඉල්ලුම්කාර තිලකරත්න මහතාට අධ්‍යක්ෂ මුදල් තනතුරේ වැඩ බැලීමේ කාල සීමාව සඳහා, වැඩ බැලීමේ පරිශ්‍රමිකයන් නොගෙවීමෙන් අසාධාරණයක් සිදුවී ඇති බවයි. ඒ අනුව, භාණ්ඩාගාර චක්‍රලේඛ 124 අනුව තනතුරක වැඩ බැලීම වෙනුවෙන් පරිශ්‍රමිකයක් ලබා ගැනීමට ඉල්ලුම්කරුට අයිතියක් ඇති බව එය සාධාරණ හා යුක්ති සහගත බවත් තීරණය කරමි.

සරත් ලියනගේ,
බේරුම්කරු.

2013.05.15

06-829